# මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව
## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. වැඩ අධිකාරි (කර්මාන්තශාලා) II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

(I) තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04ක පළපුරුද්ද.

**සටහන** තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අදාල අවුරුදු 4ක පුහුණු කාලසීමාව ඉහත පළපුරුද්දට අදාල නොවේ.

හෝ

(II) ජාතික තාක්ෂණ සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය පිළිබඳව වසර 10ක පළපුරුද්ද.

වැටුප් ක්‍රමය : රු.31,960-6x380;13x497-40,701/- (මාසික) U-MT1(I)
වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

### 02. විගණක සහකාර II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

(අ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් පැරණි නිර්දේශය යටතේ සම්මාන දෙකක් සහිතව විෂයන් හතරකින් සමත්වීම හෝ නව නිර්දේශ යටතේ සම්මාන දෙකක් සහිතව විෂයන් තුනකින් සමත්වීම

සහ

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය සහ ගණිතය/වාණිජ අංක ගණිතය සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතුය

සහ

(ආ) (I) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රාථමික අදියර/ආවසරික 1/ පදනම් අදියර,

හෝ

(II) වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ පදනම් අදියර,

හෝ

(III) ඉහත (ආ) (I) සහ (II) යටතේ සඳහන් සුදුසුකම්වලට සමාන සුදුසුකම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු සම්බන්ධව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.30,153-18x380-36,993/- (මාසික) U-MN 2(II)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

03. <u>කාර්මික නිලධාරි (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය තනතුර</u>

අවශ්‍ය සුදුසුකම් : (I) ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) [රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු/පේෂකර්ම හා ඇඟළුම් තාක්ෂණ/විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු] හෝ ඒ සමාන සුදුසුකම් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු. 28,431-7x287;9x380-33,860/- (මාසික) U-MT 1(II)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

04. <u>සැලසුම්කරු (පහළ ශ්‍රේණිය)</u>

අවශ්‍ය සුදුසුකම් : (I) පිළිගත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැළසුම් ශිල්පය පිළිබඳ විභාගය සමත්ව තිබීම.

වැටුප් ක්‍රමය : රු.25,589-7x242;10x287-30,153/-(මාසික) U-MT 1(III A)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

05. **පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම් : (I) (අ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත්ව තිබිය යුතුය.

සහ

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක කාලයක ප්‍රායෝගික කෘෂිකර්ම පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම.

හෝ

(II) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වී ඇති උසස් අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සේවයේ නියුතු හා උද්‍යාන අලංකරණ කටයුතු පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි/හෝ උද්භිත උද්‍යානයක වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.25,589-7x242;10x287-30,153/-(මාසික)U-MT1(III A)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

06. **පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම් : (I) (අ) ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු 03ක පළපුරුද්දක් ලබා තිබීම. (තුන් අවුරුදු පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකවරයකු වශයෙන් අවුරුදු 05ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.25,589-7x242;10x287-30,153-(මාසික)U-MT 1(III)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

07. <u>මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)</u>

අවශ්‍ය සුදුසුකම් : (I) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් විය යුතුයි.

වැටුප් ක්‍රමය : රු. 25,589-7x242;10x287-30,153/-(මාසික) U-MT

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

08. <u>පෙදරේරු 11 ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම් : (I) කියවීමට හා ලිවීමට හැකියාව තිබිම

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) බිත්ති පදම් කිරීමේ උපයෝගී කරගනු ලබන ඒ ඒ පතයන්, බිත්ති ආරුක්කු, කේතුමය කනු, දුම් කවුළු, කසල කානු කුහර ආදියෙහි උපයෝගී කරගනු ලබන නොයෙකුත් ආකාරයේ ගඩොල් වැඩ.

(ආ) සියළුම අන්දමේ බදමයන් ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.

(ඇ) සැලසුම් කියවීම හා සරල අන්දමේ ඉදිකිරීම් සඳහා අත්තිවාරම් දැමීම ආදිය පිළිබඳ දැනුමක් තිබීම.

(ඈ) ඉමල්ෂන් තීන්ත භාවිතයෙන් පින්තාරු කිරීමේ හැකියාව.

(III) පෙදරේරු කර්මාන්ත පිළිබඳ අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි.

වැටුප් ක්‍රමය : රු.24,209-16x218-27,697/- (මාසික) U-PL 3(III)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.05.24 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරි නමට ලිපිනය ලියු රු. 40.00ක මුද්දර ඇලවූ 25.5 සෙ.මි.x 10 සෙ.මි. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

මෙම තනතුරු ලිඛිත/ප්‍රායෝගික/වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2018.05.02